# සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා(ශ්‍රී ලංකා) සමාගමේ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් සම්බන්ධයෙන් වූ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක තැන්පත් කර තිබූ මුදල සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.8,801,648 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව රු.8,028,052 ක් වුයෙන රු.773,596 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 45,895,528 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ආ) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් | 50,463,740 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඇ) | රේගු ගාස්තු ප්‍රතිපූරණය කිරීම | 41,833,127 | රේගු ගාස්තු ගෙවීම් ලියවිලිවල මුල් |

පිටපත් සහ අදාළ උපකරණ බණ්ඩාරනායක ගුවන් තොටුපළේ අදියර II පියවර I සංවර්ධන ව්‍යාපෘතිය විසින් භාරගත් බව තහවුරු කෙරෙන ලියවිලි.

2.

## මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය සම්බන්ධයෙන් වූ මෙහෙයුම්වලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.782,480 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,772,870 ක අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,990,390 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පොලී ආදායම රු.5,075,507කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන වැඩ සටහන් අදියර II පියවර I යටතේ වූ ඉදිකිරීම් සහ සවිකිරීම් වැඩ 2007 වර්ෂය අවසාන වන විට නිමකර අවසාන ගෙවීම් ඇතුළුව රඳවාගත් මුදල් සම්පූර්ණයෙන්ම අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවා ඉංජිනේරුවරයාගේ ව්‍යාපෘති සමාපති වාර්තාවද (Engineer's Project Completion Report) 2007 ජුලි මාසයේ දී නිකුත් කර තිබියදීත් එම ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාළව රේගු ගාස්තු ප්‍රතිපූරණය කිරීමක් පිළිබඳ කරුණු දක්වමින් 2010 වර්ෂයේ දී සමාගම විසින් රු.192,000,000 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන එයින් රු.98,000,000 ක් 2010 වර්ෂයේදීත් රු.41,833,127 ක් 2012 වර්ෂයේදීත් වශයෙන් එකතුව රු.139,833,127ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

ව්‍යාපෘතිය අවසන් වී වසර 05කට පසුවත් එම කොන්ත්‍රාත් කාර්යය සඳහාම පිහිටුවා තිබු මෙම විදේශීය ඉදිකිරීම් ආයතනයේ පැවැත්ම හා රේගු ගනුදෙනුවල නිරවද්‍යතාවය පිළිබඳව ප්‍රමාණවත් තහවුරු කරගැනීමක් නොමැතිව රු.139,833,127ක මුදලක් ගෙවා තිබීම පිළිබඳව විගණනයේදී එකඟ විය නොහැක.

## 3.2 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සමාගමේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව සමාගමට අයත් පහත දැක්වෙන සම්පත් රජයේ විවිධ අමාත්‍යාංශ සහ වෙනත් ආයතන වෙත ලබා දී තිබුණි.

| | විෂයය | නිරීක්ෂණය |
| --- | --- | --- |
| (අ) | මානව සම්පත් | සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ කාර්ය මණ්ඩලයේ 25 දෙනෙකු විවිධ අමාත්‍යාංශ වෙත නිදහස් කර තිබූ අතර ඉන් 24 දෙනෙකුට වැටුප හා දීමනා වශයෙන් රු.13,360,008 ක් සමාගම වැය කර තිබුණි. |
| (ආ) | මෝටර් වාහන | සමාගමට අයත් මෝටර් වාහන 06 ක් රේඛීය අමාත්‍යාංශයට හා තවත් එක් වාහනයක් වෙනත් අමාත්‍යාංශයකට ද ලබා දී තිබුණි. එයින් වාහන 06ක නඩත්තු හා ඉන්ධන වියදම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,515,252 ක මුදලක් සමාගම විසින් වැය කර තිබුණි. |

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සමාගමේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ ) ඉඩම් අත්පත් කර ගැනීම් හා ආපසු පැවරීම්
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) තීරු බදු සහ බදු ප්‍රතිපූරණය